හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් රු.1,060,420 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 දී ජ'නල් සටහනක් මඟින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 දී ජ'නල් සටහනක් මඟින් නිවැරදි කරමි. |

(ආ) <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.57,559,641 ක ඉඩම් ගොඩනැඟිලි හා රු.1,650,854 ක විශ්‍රාම වැටුප් ණයහිමියෝ , ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම් සහිත උපලේඛන,ඔප්පු හා පිඹුරුපත්,වාර්ෂික සමීක්ෂණ වටිනාකම ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | 2019 ගිණුම් ඉදිරිපත් කිරීමේදි සියලු සාක්ෂි සහිතව ගිණුම් ඉදිරිපත් කිරීමට හැකිය. |

1.4 අනුකූල නොවීම්
නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 1 5 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 49,52 වගන්ති | සභා සීමාව තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් 14 ක් ඉවත් කිරීමට හෝ නීත්‍යානුකූලව කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | පනතේ සඳහන් කර ඇති වගන්ති වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 127 වගන්තිය | සභාව සතු සුසානභූමි 38 න් 35 ක් සඳහා ඔප්පු පැවරුම් නියෝග හා මැනුම් නියෝග ලබාගෙන ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමට සහ සුසාන භූමි වල මායිම් ලකුණු කර ගැනීම සිදුකර නොතිබුණි. | පනතේ සඳහන් කර ඇති වගන්ති වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සුසාන භූමි 10 ක පමණ මැනුම් නියෝග ලබාගෙන මැනුම් කටයුතු සිදු කර ඇති අතර,ඉතිරි සුසාන භූමි සඳහා මැනුම් නියෝග ලබාගැනීමට කටයුතු කරමි. |
| | (iii) 149 වගන්තිය | සභා සීමාව තුල ඇති හෝටල් 05 කින් වාර්ෂික පිරිවැටුමින් සියයට 1 ක් දක්වා සභාවට අයකරගත හැකි වුවද, එසේ අය කරගෙන නොතිබුණි. | පිරිවැටුමෙන් 1% ක් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදි නිවැරදි ලෙස සියයට එකක බදු ආදායම ගණනය කර අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා(මූල්‍ය හා පරිපාලන )රීති සංග්‍රහයේ රීති 114 | අත්තිකාරම් ලබාගෙන එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.466,931 ක් විය. | අත්තිකාරම් පිය වීමට කටයුතු කළ යුතුවේ. | 1994 වර්ෂයේ සිට මෙම ශේෂය පවතින අතර ඉදිරියේදි පියවා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | රජයේ තක්සේරුවකුගේ තක්සේරුවක් ලබා නොගෙන සභාව විසින් තීරණය කළ මාසික කුලියකට කඩ කාමර ලබාදී තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | 2018 ජනවාරි 20 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගත් අතර, එහි කුලි වටිනාකම දැනට පවතින කුලියට වඩා 3 ගුණයකින් පමණ වැඩිවී තිබීම නිසා නව තක්සේරුවක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,784,399 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,389,311ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 566,085 | 565,043 | 512,436 | 208,850 | 566,085 | 555,011 | 400,975 | 248,327 |
| ii. | කඩ කුලී | 587,520 | 588,560 | 382,370 | 783,590 | 587,520 | 586,920 | 463,590 | 699,770 |
| iii. | අක්කර බදු | 73,561 | 77,497 | 53,897 | 128,713 | 73,561 | 77,077 | 42,629 | 154,075 |
| | ජල බදු | 1,527,100 | 1,466,068 | 1,046,457 | 524,793 | 1,527,100 | 1,512,740 | 1,157,833 | 398,973 |
| | බිම් බදු කුලී | 216,000 | 216,000 | 211,000 | 60,500 | 216,000 | 216,000 | 132,000 | 103,579 |
| | එකතුව | 2,970,266 | 2,913,168 | 2,206,160 | 1,706,446 | 2,970,266 | 2,947,748 | 2,197,027 | 1,604,724 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරනලද රු.2,913,168 ක් මුළු ආදායමින් වර්ෂය අවසානය වනවිට රු.1,706,446 ක් අය කරගෙන නොතිබුණු අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 59 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අය කරගත යුතුවේ. | දිගින් දිගටම පවතින හිඟ කඩ කාමර කුලි රු.430,000 අය කර ගැනීමට නඩු පැවරීමක් කර ඇති අතර ඉතිරි හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ගිණුම්වල එකතුව රු.12,196,185 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු3,500,783 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | මේ වනවිට රු.627,726 ක් අය කරගෙන ඇති අතර, ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) මුද්දර ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තු රු.9,253,897 ක් අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මේ වන විට අය කරමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට කාරණා 06 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ත්‍රිරෝද ගාල් කිරීම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව සකස් කරමින් පවතී. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදි ඒ අනුව කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 06 කට අදාලව අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි. | කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුවේ. | අතිරික්ත තනතුරු කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 05 කට අදාලව පුරප්පාඩු 08 ක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරදෙන ලෙසට පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇත. |
| (ඇ) | සේවය හැර ගිය එක් නිලධාරියෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.26,920 ක ණය ශේෂය අය කරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළයුතුවේ. | අදාල පාර්ශවයට කිහිප වරක්ම ලිපි මගින් දැනුවත් කර ඇති අතර, ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරමි. |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ත්‍රීරෝද රථ සඳහා වාර්ෂික අවසර පත්‍ර ගාස්තු අය කිරීමට අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.සභා තීරණයක් අනුව ත්‍රීරෝද රථ ගාල් කිරීමට වාර්ෂික අවසරපත්‍රයක් සඳහා රු.600 ක් අයකළ යුතු වුවද, ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි ත්‍රීරෝද රථ 97 ක් සඳහා ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.69,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | ත්‍රීරෝද රථ 97 න් 61 ක් සඳහා මේවන විට මුදල් අය කරගෙන ඇති අතර, ඉතිරි 26 සඳහා හිඟ මුදල් අය කරමින් පවතී. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ණයහිමියෝ රු.12,260,251 ක් සමාලෝචිත වර්ෂයේදිද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි මුදල් ප්‍රතිපාදන ලබාගෙන මෙම ගෙවීම් සිදු කිරීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය
නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.6,705,669ක් වැයකර ඉදිකරතිබුණු වෙළද සංකීර්ණය භාවිතා කිරිමට මාර්ගයක් නොමැතිවීම හේතුවෙන් වෙළද සංකීර්ණය ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | නිෂ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර වලට ප්‍රවේශවීම සඳහා ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීමට ප්‍රතිපාදන ලබාගැනීමට විවිධ රාජ්‍ය අමාත්‍යාංශ වලින් ඉල්ලීම් කර ඇතත්, මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009 (01) දරන 2009 ජූනි 09 දිනැති චක්‍රලේඛය අනුව කාර්තුවකට එක් වරක් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |